# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 14,930/7 — 1970 නොවැම්බර් 2 වැනි සඳුද — 1970.11.2

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)


# IV වැනි කොටස – පළාත් පාලනය

## පළාත් පාලන නිවේදන

### ගම්සභා අඥපනත

54 වැනි වගන්තිය යටතේ ආඥව

(257 වැනි අධිකාරය වන) ගම්සභා ආඥපනතේ 54 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, රාජ්‍ය පරිපාලන, පළාත් පාලන සහ ස්වදේශ කටයුතු ඇමති ෆීලික්ස් රෙජිනෝල්ඩ් ඩයස් බණ්ඩාරනායක වන මම, කුරුණෑගල දිස්ත්‍රික්කයේ මහව ගම් ප්‍රදේශයේ ගම්සභාවේ සභාපති වාසල මුදියන්සේලාගේ පුංචිබන්ඩාගේ පුංචිරාල මහතා සම්බන්ධයෙන් :—

(අ) අදක්ෂතාවය සහ අයථා පාලනය,

(ආ) ගම්සභා ආඥපනතින් පැවරී ඇති රාජකාරි කටයුතු ඉටු කිරීම ඕනෑකමින්ම පැහැර හැරීම, සහ

(ඇ) එකී ආඥපනතින් පැවරී ඇති රාජකාරි කටයුතු ඉටුකිරීමෙහිලා විෂමාචාරයෙන් කටයුතු කිරීම,

යන මේවා ඔප්පුවන ප්‍රමාණවත් සාක්ෂි තිබෙන බවට මා සෑහීමට පත්ව තිබෙන බැවින්, එකී වාසල මුදියන්සේලාගේ පුංචිබන්ඩාගේ පුංචිරාල මහතා එකී ගම්සභාවේ සභාපති ධුරයෙන් මේ ආඥවෙන් ඉවත් කරමි.

ෆී. ආර්. ඩී. බණ්ඩාරනායක,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා
ස්වදේශ කටයුතු ඇමති.

1970 නොවැම්බර් මස 2 දින,
කොළඹ දී ය.

11—261/1

---

### ගම්සභා ආඥපනත

(257 වැනි අධිකාරය වන) ගම්සභා ආඥපනතේ 8 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු ඇමති ෆීලික්ස් රෙජිනෝල්ඩ් ඩයස් බණ්ඩාරනායක වන මම, මෙම නිවේදනයෙන් කොළඹ දිස්ත්‍රික්කයේ ඔයබඩපේරුව ගම් ප්‍රදේශයේ දැනට පවත්නා ඡන්ද කොට්ඨාශ නැවත බෙදීමට අදාලව අංක 14,912/8 සහ 1970 ජූලි මස 2 වැනි දින අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නිවේදනය එහි වූ උපලේඛනය වෙනුවට මීට යාකොට ඇති උපලේඛනය යෙදීමෙන් සංශෝධනය කරනු ලැබේ.

ෆී. ආර්. ඩී. බණ්ඩාරනායක,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා
ස්වදේශ කටයුතු ඇමති.

1970 නොවැම්බර් මස 2 දින,
කොළඹ දී ය.

1 A—— ජේ 17841—5,700 (70/10)

## උපලේඛනය

| I වැනි තීරය<br>දැනට පවත්නා ඡන්ද කොට්ඨාශ | II වැනි තීරය<br>නව ඡන්ද කොට්ඨාශ |
|---|---|
| අංක 308/309 කොස්කඳවල ග්‍රාම සේවක කොට්ඨාශය ... | අංක 1 දරන ඡන්ද කොට්ඨාශය—කොස්කඳවල, කොස්කඳවල ගමින් සමන්විතය.<br>අංක 2 දරන ඡන්ද කොට්ඨාශය—කිරිකිත්ත මුල්ල, කිරිකිත්ත මුල ගමින් සමන්විතය. |
| අංක 310/311 සහ අංක 312 ග්‍රාම සේවක කොට්ඨාශ ... | අංක 3 දරන ඡන්ද කොට්ඨාශය—වීරගුල, වීරගුල ගමින් සමන්විතය.<br>අංක 4 දරන ඡන්ද කොට්ඨාශය—උඩතුන්තිරිපිටිය, උඩතුන්තිරිපිටිය, පල්ලෙතුන්තිරිපිටිය, කොරසගොඩ හා මට්ටගොඩ යන ගම්වලින් සමන්විතය.<br>අංක 5 දරන ඡන්ද කොට්ඨාශය—කහඹිලියාහේන, කහඹිලියාහේන ගමින් සමන්විතය. |
| අංක 313 ග්‍රාම සේවක කොට්ඨාශය ... ... | අංක 6 දරන ඡන්ද කොට්ඨාශය—බෝනෑගල, බෝනෑගල හා ගොරකාදෙනිය යන ගම්වලින් සමන්විතය |
| අංක 314 ග්‍රාම සේවක කොට්ඨාශය ... ... | අංක 7 දරන ඡන්ද කොට්ඨාශය—ඕගොඩපොල, ඕගොඩපොල ගමෙන් සමන්විතය. |
| අංක 315 සහ අංක 316 ග්‍රාම සේවක කොට්ඨාශ ... | අංක 8 දරන ඡන්ද කොට්ඨාශය—මීවල, මීවල ගමෙන් සමන්විතය.<br>අංක 9 දරන ඡන්ද කොට්ඨාශය—බෝගොඩ–කිත්තම්මහර, බෝගොඩ සහ කිත්තම්මහර යන ගම්වලින් සමන්විතය |
| අංක 318 ග්‍රාම සේවක කොට්ඨාශය ... ... | අංක 11 දරන ඡන්ද කොට්ඨාශය—තිහාරිය බටහිර, උතුරට : කටුවස්ගොඩ ග්‍රාම සේවක කොට්ඨාශයේ සීමාවෙන්ද , නැගෙනහිරට : තිහාරිය–වරපලාන රජයේ වැඩ දෙපාර්තමේන්තු පාරේ අංක 1/3 බෝක්කුව දක්වා එකී පාර හා තිහාරිය–කටුවස්ගොඩ ගම් සභා පාරේ මධ්‍ය රේඛාවලින් ද, දකුණට : අත්තනගලු ඔයෙන්ද, තිහාරිය වෙල්යායේ උතුරු ඇලෙන් හා ජලපවාහන ඇලෙන්ද, බස්නාහිරට : කළගෙඩිහේන ග්‍රාම සේවක කොට්ඨාශයේ නැගෙනහිර සීමාවෙන්ද, මායිම් වූ ප්‍රදේශයෙන් සමන්විතය.<br>අංක 12 දරණ ඡන්ද කොට්ඨාශය—තිහාරිය නැගෙනහිර, උතුරට : කටුවස්ගොඩ ග්‍රාම සේවක කොට්ඨාශයේ නැගෙනහිර මායිමෙන්ද, නැගෙනහිරට : නිට්ටඹුව ග්‍රාම සේවක කොට්ඨාශයේ බටහිර මායිමෙන්ද, දකුණට : තිහාරිය වෙල්යායේ උතුරු ඇලෙන්ද, බස්නාහිරට : තිහාරිය–කටුවස්ගොඩ ගම්සභා පාරේ මධ්‍ය රේඛාවෙන් හා තිහාරිය වරපලාන රජයේ වැඩ දෙපාර්තමේන්තු පාරේ 1/3 බෝක්කුව දක්වා එම පාරේ මධ්‍ය රේඛාවෙන්ද, මායිම් වූ ප්‍රදේශයෙන් සමන්විතය.<br>අංක 13 දරන ඡන්ද කොට්ඨාශය—තිහාරිය දකුණ, උතුරට : තිහාරිය වෙල්යායේ උතුරු ඇලෙන් ද, නැගෙනහිරට : කලෝටුවාව හා කත්කොට ග්‍රාම සේවක කොට්ඨාශවල මායිම් වලින් ද, දකුණට : අත්තනගලු ඔයෙන්ද, බටහිරට : තිහාරිය වෙල්යායේ උතුරු ඇලෙන් හා ජලපවාහන ඇලෙන්ද මායිම් වූ ප්‍රදේශයෙන් සමන්විතය. |

ලංකාණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රාපිතයි.